# බළන්ගොඩ නගර සභා රැස්වීම් වාර්තාව

ස්ථානය : බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව.

දිනය : 2009.11.26
වේලාව : පෙ.ව.10.00

බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපති, ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සභාවේ කටයුතු පවත්වන ලදී.

**සහභාගීත්වයඃ-**

01. ගරු සභාපති, ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා
02. ගරු නගර සභා මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා.
03. ගරු නගර සභා මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා
04. ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.ඒ. වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා
05. ගරු නාගරික මන්ත්‍රී එම්. නිමල් කරුණාරත්න මැතිතුමා
06. ගරු නගර සභා මන්ත්‍රී එම්.ටී.එම්. රුමි මැතිතුමා

**සහභාගී නොවූවෝ ඃ-**

01. ගරු උපසභාපති සුමේද චාමින්ද බස්නායක මැතිතුමා
02. ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.විමලසේන මැතිතුමා
03. ගරු නගර සභා මන්ත්‍රී යූ.එච්. ගාමිණී මැතිතුමා

**නිලධාරී සහභාගීත්වයඃ-**

01. නාගරික ලේකම් ආර්.ඩී.නලින් පුෂ්පකුමාර මහතා.

(01) **ආගම සිහිකිරිමඃ**

රැස්වීමට පැමිණ සිටි සියළු දෙනා තම තමන්ගේ ආගම සිහිකිරීමෙන් අනතුරුව රැස්වීමේ කටයුතු ආරම්භ කරන ලදි.

(02) **ගරු සභාපතිතුමා විසින් කරනු ලබන නිවේදනඃ**

ගරු සභාපතිතුමා කථාකරමින්, අද දින සභා රැස්වීමට සහභාගීවීමට පැමිණ සිටින ගරු නාගරික මන්ත්‍රීතුමන්ලා,ලේකම් මහතා ඇතුළු සියළු දෙනා සාදරයෙන් පිළිගන්නා බව පැවසීය.

ඉන් අනතුරුව අදහස් දැක් වූ ගරු සභාපතිතුමා , සබරගමුව පළාත් සභාවෙන් කාර්යාල නවීකරණය සඳහා ලැබුණු රු.ලක්ෂ 20 ක මුදල උපයෝගීකරගෙන ඉදිකල නව සභා ගර්භය 2009.11.12 වන දින සුභ මොහොතින් විවෘතකල බව දැන්වීය.

තමන් මෙම සභාවේ නාගරික මන්ත්‍රීවරයෙකු,විපක්ෂනායකවරයෙකු හා දෙවතාවක් සභාපතිවරයෙකු ලෙස වසර 18 ක පමණ කලක් සේවය කල බැවින් අත්දැකීම සම්භාරයක් ලබා ඇති අතර එතුළින් සභාවේ කටයුතු වඩාත් නිවැරදිව , නීත්‍යානුකූලව ඉටුකිරීමට සෑම විටම ක්‍රියාකරන බව දැන්වීය. ඇතැම් අවස්ථාවල දී සභා තීන්දු විධිමත් රීතීන්ට අනුකූල නොවීම නිසා විවිධ ගැටළු වලට අපහසුතාවලට ලක්වීමට සිදු වූ අවස්ථාවන් තිබුණු බවත් , එබැවින් මින් ඉදිරියට සභාවේ කටයුතු වඩාත් නිවැරදිව සහ සභා රීතීන්ට අනුකූලව ඉටුකිරීමට හැකි සෑම පියවරක්ම ගන්නා බැවින් , ඒ සඳහා ගරු මන්ත්‍රීවරුන්ගේ ද සහයෝගය අපේක්ෂා කර බව දැන්වීය.

අතිගරු ජනාධිපතිතුමාගේ හැට හතර වන ජන්ම දිනය හා සිව්වන පදවි ප්‍රාප්තිය නිමිතිකරගෙන බළන්ගොඩ නගර සභාව විසින් සබරගමුව පළාත් ගරු ප්‍රධාන අමාත්‍ය මහීපාල හේරත් මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් උත්සව මාලාවක් පැවැත්වූ බවත්, විදුනැණ පියස තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය හා කියවීම් ශාලාව නිල වශයෙන් ජනතා අයිතියට පත් කිරිමත්, කියවීම් ශාලා භූමියේ තුරු උයන රාජපක්ෂ වන උයන ලෙස නම් කිරිමත්, පළාත් සභා ආධාර යටතේ ඉදිකරනු ලැබූ ඇල්ලෙපොල ගල්බැම්ම ගොඩහේන මාර්ගයත්, කුමාරගම පළමුවන පටුමග විවෘත කිරීමත් සිදු කරනු ලැබූ බව ද දන්වන ලදී.

තවදුරටත් කථා කල ගරු සභාපතිතුමා , පළාත් පාලන ආයතන වලට වැඩි වරප්‍රසාද ලබාදෙමින් , මෙම ආයතන වඩාත් ශක්තිමත් ආයතන බවට පත්කිරීම සඳහා ඉදිරි පළාත් පාලන මැතිවරණ ආසන ක්‍රමයට පැවැත්වීමට අවශ්‍ය කෙටුම්පත් සකස් කෙරෙමින් පවතින බව දැන්වීය.

සබරගමුව පළාත් සභාවේ ගරු පළාත් මාර්ග සංවර්ධන අමාත්‍ය ජානක වක්කුඹුර මැතිතුමා , මාර්ග සංවර්ධන කටයුතු සඳහා රු. ලක්ෂ 10 ක මුදලක් ලබාදුන් අතර , බළන්ගොඩ ශ්‍රී ලංකා නිදහස් පක්ෂ සම සංවිධායක හා පේෂකර්ම සංවර්ධන ගරු අමාත්‍ය මහින්ද රත්නතිලක මැතිතුමා මෙම ප්‍රදේශයේ සංවර්ධන කටයුතු සඳහා රු.ලක්ෂ 40 ක මුදලක් වෙන්කරදීම නිර්දේශ කර ඇති බව බව සතුටින් යුතු සඳහන් කරන බව දැන්වීය. එතුමන්ලා ප්‍රදේශයේ සංවර්ධන උදෙසා දක්වනු ලබන අනුග්‍රහය/සහයෝගය ඉතාමත් අගය කරන අතර , ඒ සම්බන්ධව සභාවේ ස්තූති පූර්වකව ප්‍රණාමය පළකර සිටින අතර , ඒ බව දන්වා යැවීමට ද යෝජනා කරන ලදී. එසේම බළන්ගොඩ ප්‍රධාන සංවිධායක භාණු මුණිප්‍රිය මැතිතුමා එතුමාට වෙන් වූ ප්‍රතිපාදන වලින් නගර සභා ප්‍රදේශයේ සංවර්ධන කටයුතු වලට කිසිදු ප්‍රතිපාදනයක් මෙම සභාව වෙත වෙන්කර නොදුන් බැවින් ඒ සම්බන්ධව සිය කණගාටුව ප්‍රකාශ කරන බව සඳහන් කරන ලදී.

2008 වසරේ පළාත් පාලන ආයතන අතර පැවති කළමනාකරණ තරඟයෙන් පළාත් මට්ටමින් නගර සභා අතරින් මෙම නගර සභාව ප්‍රථම ස්ථානයත් , 2009 වසරේ පළාත් පාලන ආයතන අතර පුස්තකාල තේරීමේ තරඟයෙන් බළන්ගොඩ නගර සභා මහජන පුස්තකාලය රත්නපුර දිස්ත්‍රික්කයේ ප්‍රථම ස්ථානයත් , පළාත් පාලන ආයතන අතර , ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථානය තේරීමේ තරඟයෙන් බළන්ගොඩ නිදහස් ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථානය තෙවන ස්ථානයත් ලබාගෙන ඇති බව ඉතාමත් සතුටින් යුතුව සඳහන් කරන බව පැවසීය. මෙම ආයතනය විසින් ඉටුකරනු ලබන විශිෂ්ඨ සේවාවන් වෙනුවෙන් හිමිවිය යුතු වූ ගෞරවය හිමිව ඇති බැවින් , මෙම උදාර කර්තෘවයට දායකත්වය ලබාදුන් මෙම සභාවේ ලේකම් මහතා ඇතුළු සමස්ථ කාර්ය මණ්ඩලය සභාවේ සුභාශිංසනය පළකරන අතර, සියළු දෙනාගේම පෞද්ගලික ලිපිගොනුව වලට ප්‍රශංසාත්මක ලිපි ඇතුළත් කරන ලෙස ලේකම් මහතා වෙත උපදෙස් ලබාදෙමින් සභාවේ ඉදිරි වැඩ කටයුතු ආරම්භ කරන ලදී.

**(03) 2009.10.29 වන දින වන දින පවත්වන ලද මාසික මහ සභා රැස්වීමේ වාර්තාව හා 2009.11.12 දින පවත්වන ලද විශේෂ මහ සභා රැස්වීමේ වාර්තාව සත්‍ය වාර්තාවක් බවට සභා සම්මත කිරීම :**

2009.10.29 වන දින පවත්වන ලද මාසික මහ සභා රැස්වීමේ වාර්තාව සත්‍ය වාර්තා හා 2009.11.12 පවත්වන ලද විශේෂ මහ සභා රැස්වීමේ වාර්තාව සත්‍ය වාර්තාවක් බවට ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා විසින් යෝජනා කරන ලද අතර, එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් එම වාර්තා සභා සම්මත විය.

(04) <u>පසුගිය වාර්තාවන් සමාලෝචනය කිරීම:</u>

පසුගිය වාර්තාවන් සමාලෝචනය කිරීමක් සිදුනොවීය.

❖ මෙම අවස්ථාවේ දී ගරු නාගරික මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා සභාව වෙත පැමිණ සභාවේ අසුන් ගන්නා ලදී.

05. **<u>සභාවට ඉදිරිපත් වී ඇති ලිපි/පෙත්සම්/පැමිණිලි ආදිය ඉදිරිපත් කිරීම:</u>**

05:01 **<u>2010 වර්ෂය සඳහා වරිපනම් බදු පැනවීම:</u>**

ඉහත සඳහන් කාරණයට අදාළව ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

255 වන අධිකාරිය වන නගර සභා ආඥා පනතේ 166 වන වගන්තිය සමඟ කියවිය යුතු 252 වන අධිකාරය වන මහා නගර සභා ආඥා පනතේ 238 වන වගන්තියේ (1) උප වගන්තියෙන් නගර සභා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර බළන්ගොඩ නගර සභා බල ප්‍රදේශය ඇතුළත (අලුතින් එක්වූ ප්‍රදේශ හැර) පිහිටි සියළුම නිවාස වල , ගොඩනැගිලිවල , ඉඩම්වල හා ගෙපත්වල 2009 වර්ෂයේ වාර්ෂික වටිනාකම් 2010 වර්ෂයේ වාර්ෂික වටිනාකම ලෙස පිළිගැනීමටත් ,

එකී නගර සභා ආඥා පනතේ 160 වන වගන්තියෙන් ලැබී ඇති බලතල ප්‍රකාර ඉහත කී වාර්ෂික වටිනාකමෙන් -

(අ) නේවාසික ස්ථාන මත සියයට හතර ( 4% ) ක වරිපනමක් ද : සහ

(ආ) වෙළඳ හෝ වාණිජ කාර්යය සඳහා පාවිච්චි කරනු ලබන ස්ථාන මත සියයට පහ (5%) ක වරිපනමක් ද ,

2010 වර්ෂය සඳහා පනවා අයකිරීමටත් සහ ඒ වරිපනම්, එකී නගර සභා ආඥා පනතේ 170 වන වගන්තිය සමඟ කියවිය යුතු ඉහත කී මහා නගර සභා ආඥා පනතේ 230 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ විධි විධාන යටතේ එකී වර්ෂයේ මාර්තු 31 , ජුනි 30 , සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනවල දී අවසන් වන කාර්තු හතර තුළදී සමාන වාරික හතරකින් ගෙවීමට විධාන කිරීමටත් සුදුසු බව ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් යෝජනා කල අතර , එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් එම යෝජනාව සභා සම්මත විය.

## 05:02 2010 වර්ෂය සඳහා නිකුත් කරනු ලබන බලපත්‍ර මත ගාස්තු පැනවීම :

නගර සභාව විසින් සාදන ලද අතුරු ව්‍යවස්ථාවක් යටතේ හෝ බළන්ගොඩ නගර සභාව විසින් පිළිගෙන ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවක් යටතේ බළන්ගොඩ නගර සභාව විසින් 2010 වර්ෂය තුලදී නිකුත් කරනු ලබන බලපත්‍ර සම්බන්ධයෙන්, 255 වන අධිකාරිය වන නගර සභා ආඥාපනතේ 162 වන වගන්තිය සමග කියවිය යුතු 164 වන වගන්තියෙන් නගර සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර පහත උප ලේඛනයේ 1 වන තීරුවේ සඳහන් එක් එක් කර්මාන්තය වෙනුවෙන්, එම උපලේඛනයේ 11 වන තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත ප්‍රමාණයක බලපත්‍ර ගාස්තුවක් පනවා අයකිරීමට ගරු නාගරික මන්ත්‍රී, එම්.ටී.එම්.රුමී මැතිතුමා විසින් යෝජනා කල අතර , එම යෝජනා ගරු නාගරික මන්ත්‍රී, එම්.නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කිරිමෙන් එම යෝජනාව සභා සම්මත විය.

| 1 වන තීරුව | | 11 වන තීරුව | | |
|---|---|---|---|---|
| අනු අංකය | කර්මාන්තයේ හෝ ව්‍යාපාරයේ ස්වභාවය | ස්ථානයේ වාර්ෂික වටිනාකම රුපියල්<br>750 නොඉක්මවන අවස්ථාවක | 750 ට වැඩි එහෙත් 1.500 නොඉක්මවන අවස්ථාවක | 1,500 ඉක්මවන අවස්ථාවක |
| 01. | නවාතැන් පලක් පවත්වාගෙනයාම | 500.00 | 750.00 | 1000.00 |
| 02. | තේ හෝ කෝපි කඩයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 03. | හෝටලයක් පවත්වාගෙනයාම | 500.00 | 750.00 | 1000.00 |
| 04. | බේකරියක් පවත්වාගෙනයාම | 500.00 | 750.00 | 1000.00 |
| 05. | බාබර් සාප්පුවක් පවත්වාගෙනයාම | 500.00 | 750.00 | 1000.00 |
| 06. | ගෝඝාතනාගාරයක් පවත්වාගෙනයාම | 500.00 | 750.00 | 1000.00 |
| 07. | භෝජනාගාරයක් (රෙස්ටුරන්ට්) පවත්වාගෙනයාම | 500.00 | 750.00 | 1000.00 |
| 08 . | බත් කඩයක් පවත්වාගෙනයාම | 500.00 | 750.00 | 1000.00 |
| 09. | ලොන්ඩරියක් පවත්වාගෙනයාම | 500.00 | 750.00 | 1000.00 |
| 10. | කිරිපට්ටියක් පවත්වාගෙනයාම | 500.00 | 750.00 | 1000.00 |
| 11. | මස් හෝ මාළු විකිණීම | 500.00 | 750.00 | 1000.00 |

## 05:03 2010 වර්ෂය සඳහා කර්මාන්ත බද්ද පැනවීම:

255 වන අධිකාරය වන නගර සභා ආඥාපනතේ 165අ වන වගන්තියෙන් නගර සභාවලට පැවරී ඇති බලතල ප්‍රකාර බළන්ගොඩ නගර සභා බල ප්‍රදේශය ඇතුළත කරගෙන යනු ලබන පහත උපලේඛනයේ 1 වන තීරුවේ සඳහන් එක් එක් කර්මාන්තය වෙනුවෙන් , එම උප ලේඛනයේ 11 වන තීරුවේ, ඒ එක් එක් කර්මාන්තය පවත්වාගෙන යනු ලබන ස්ථානයේ වාර්ෂික වටිනාකමට අනුරූප තීරුවේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2010 වර්ෂය සඳහා පනවා අයකළ යුතු බවටත් , එකී කර්මාන්ත බද්දට යටත් තැනැත්තෙකු 2010 වර්ෂයේ අප්‍රේල් මස 30 වන දිනට පෙර බළන්ගොඩ නගර සභා කාර්යාලයට ගෙවිය යුතු බවට ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා යෝජනා කල අතර , එම යෝජනාව , ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් සභා සම්මත විය.

## උපලේඛනය

| | 1 වන තීරුව | 11 වන තීරුව | | |
|---|---|---|---|---|
| අනු අංකය | කර්මාන්තයේ ස්වභාවය | ස්ථානයේ වාර්ෂික වටිනාකම රුපියල්<br>750 නොඉක්මවන අවස්ථාවක | 750 ට වැඩි එහෙත් 1.500 නොඉක්මවන අවස්ථාවක | 1,500 ඉක්මවන අවස්ථාවක |
| 01. | කුෂන් වැඩ කිරිම | 500.00 | 750.00 | 1000.00 |
| 02. | ගීත පටිගත කිරීම හෝ තැටිගත කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 03. | ඇස් කණ්නාඩි විකිණීම | 500.00 | 750.00 | 1000.00 |
| 04. | දැව ඉරුම් පට්ටලයක් (ලී මෝලක්) පවත්වාගෙනයාම | 500.00 | 750.00 | 1000.00 |
| 05. | ගොඩනැගිලි ද්‍රව්‍ය විකිණීම | 500'00 | 750'00 | 1000.00 |
| 06. | පොල්තෙල් විකිණීම | 500.00 | 750.00 | 1000.00 |
| 07. | ස්වර්ණාභරණ නිපදවීම හා/හෝ විකිණීම | | | 1000.00 |
| 08. | මුද්‍රණාලයක් පවත්වාගෙනයාම | 500.00 | 750.00 | 1000.00 |
| 09. | බයිසිකල් හා/හෝ බයිසිකල් අමතර කොටස් විකිණීම | 500.00 | 750.00 | 1000.00 |
| 10. | පින්තූර රාමු කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 11. | ටයර් හෝ ටියුබ් විකිණීම හා/හෝ වොල්කනයිස් කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 12. | මෝටර් බයිසිකල් අළුත්වැඩියා කිරිම හා/හෝ විකිණීම | 500.00 | 750.00 | 1000.00 |
| 13. | කම්මලක් පවත්වාගෙනයාම | 500.00 | 750.00 | 1000.00 |
| 14. | මැටිභාණ්ඩ නිෂ්පාදනය | 500.00 | 750.00 | 1000.00 |
| 15. | උළු අලෙවි කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 16. | සිමෙන්ති ගඩොල් නිපදවීම හා/හෝ විකිණීම | 500.00 | 750.00 | 1000.00 |
| 17. | තේ කර්මාන්ත ශාලාවක් පවත්වාගෙනයාම | 500.00 | 750.00 | 1000.00 |
| 18. | වඩු කර්මාන්ත ශාලාවක් පවත්වාගෙනයාම | 500.00 | 750.00 | 1000.00 |
| 19. | ලී බඩු අලෙවිකිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 20. | මිනීපෙට්ටි විකිණීම හා/හෝ නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| 21. | බ්රේක් ලයිනර් විකිණීම හා/හෝ නිෂ්පාදනය | 500.00 | 750.00 | 1000.00 |
| 22. | ජල පොම්ප අමතර කොටස් අලෙවිකිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 23. | ජංගම දුරකථන අලෙවිකිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 24. | ටයිල් අලෙවිකිරීම හා/හෝ නිෂ්පාදනය කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 25. | වාහන අමතර කොටස් අලෙවිකිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 26. | ඇළුමිණියම් භාණ්ඩ අලෙවිකිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 27. | පපඩම් නිෂ්පාදනය | 500.00 | 750.00 | 1000.00 |
| 28. | වීදුරු භාණ්ඩ අලෙවිකිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 29. | පිත්තල භාණ්ඩ අලෙවිකිරීම | 500.00 | 750.00 | 1000.00 |

| | | | |
|---|---|---|---|
| 30. ඇඹරුම්හලක් පවත්වාගෙනයාම | 500.00 | 750.00 | 1000.00 |
| 31. වී මෝලක් පවත්වාගෙනයාම | 500.00 | 750.00 | 1000.00 |
| 32. මැණික් කැපීම හා ඔපදැමීමේ ස්ථානයක් පවත්වාගෙනයාම | 500.00 | 750.00 | 1000.00 |
| 33. ලී වෙළඳසැලක් පවත්වාගෙනයාම | 500.00 | 750.00 | 1000.00 |
| 34. ලියවන පට්ටලයක් පවත්වාගෙනයාම | 500.00 | 750.00 | 1000.00 |
| 35. ගමන් මලු හෝ පාවහන් සැකසීම | 500.00 | 750.00 | 1000.00 |
| 36. සත්ව ආහාර අලෙවිකිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 37. කොන්ක්‍රීට් නිෂ්පාදන | 500.00 | 750.00 | 1000.00 |
| 38. පාවහන් අලෙවි කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 39. දිය ලුණු පැකට් කිරීම | 500.00 | 750.00 | 1000.00 |

05:04 **2010 වර්ෂය සඳහා ව්‍යාපාර බද්ද පැනවීම:**

255 වන නගර සභා ආඥාපනතේ 165ආ වන වගන්තියෙන් නගර සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර, එකී ආඥාපනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම හෝ එකී ආඥාපනතේ 165අ වන වගන්තිය යටතේ යම් කර්මාන්ත බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නාවූ හා වෘත්තියක් නොවන්නාවූ කිසියම් ව්‍යාපාරයක් බළන්ගොඩ නගර සභා බල ප්‍රදේශය ඇතුළත 2010 වර්ෂයේදී කරගෙන යනු ලබන සෑම තැනැත්තෙකුගෙන්ම , එකී ව්‍යාපාරයේ ඊට පෙර වර්ෂයේ ලැබීම් මෙහි පහත උප ලේඛනයේ 1 තීරුවේ නිරූපිත යම් විෂයාංකයක සීමාවන් ඇතුලත පවත්නා අවස්ථාවක එහි 11 වන තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත අනුප්‍රමාණය අනුව වූ ව්‍යාපාර බද්දක් 2010 වර්ෂය සඳහා පනවා අය කිරීමටත් , බද්දට යටත් සෑම තැනැත්තකුම එකී ව්‍යාපාර බද්ද 2010 වර්ෂයේ අප්‍රේල් මස 30 වන දිනට පෙර බළන්ගොඩ නගර සභා කාර්යාලයට ගෙවිය යුතු බවට ගරු සභාපතිතුමා විසින් යෝජනා කල අතර , එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී , එම්.නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් සභා සම්මත විය.

උපලේඛනය

| | 1 වන තීරුව<br>බද්ද අදාළ වන වර්ෂයට පෙර වර්ෂයේ<br>ව්‍යාපාරයෙන් ලත් ලැබීම් ප්‍රමාණය | 11 වන තීරුව<br>ගෙවිය යුතු බද්ද<br>රු. ශත |
|---|---|---|
| 1. | රු. 6,000 නොඉක්මවන අවස්ථාවක | නැත |
| 2. | රු. 6,000 ඉක්මවන නමුත් 12,000 නොඉක්මවන විට | 90.00 |
| 3. | රු. 12,000 ඉක්මවන නමුත් 18,750 නොඉක්මවන විට | 180.00 |
| 4. | රු. 18,750 ඉක්මවන නමුත් 75,000 නොඉක්මවන විට | 360.00 |
| 5. | රු. 75,000 ඉක්මවන නමුත් 1,50,000 නොඉක්මවන විට | 1,200.00 |
| 6. | රු. 1,50,000 ඉක්මවන විට | 3,000.00 |

**05:05 බළන්ගොඩ නව බස්නැවතුම්පල හා වෙළඳ සංකීර්ණයේ කඩ කාමර සභාවට පවරා ගැනීම:**

උක්ත කරුණට අදාළව ඉදිරිපත් කර ඇති 2009.11.25 දිනැති ලිපිය සභාගත කරන ලදී.

බළන්ගොඩ නව බස්නැවතුම්පලෙහි කුලී පදනම මත බදු දී ඇති කඩ කාමර වල කුලී මුදල් නොගෙවීම හේතුවෙන් අංක : ඩී.11, ඩී.14, ඩී.21, ඩී.22 , බී.18 ,ඩී.01 ,ඩී.20 බී.31 කඩ කාමර නැවත සභාවට පවරා ගැනීමට තීරණය කරන ලදි. එම කඩ කාමර නැවත බදුදීම සම්බන්ධව තීරණයක් ගැනීම සුදුසු බව එමගින් සඳහන් කර තිබුණි.

පළාත් පාලන කොමසාරිස්තුමියගේ අනුමැතියට යටත්ව , අදාල තක්සේරු මුදල අවම ලංසුව සේ සලකා නැවත ටෙන්ඩර් කිරීම සුදුසු බව ගරු සභාපතිතුමා යෝජනා කළ අතර , එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම්.රුමී මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් සභා සම්මත විය.

05:06 **<u>බළන්ගොඩ පොදු වෙළඳසැලේ අංකඃ 08 දරණ කඩ කාමරයේ බදුකරුට නගරාධිපතිවරයා විසින් සිදුකරන අක්‍රමිකතා පිළිබඳවයි ඃ</u>**

ඉහත සදහන් කරුණට අදාළව පළාත් පාලන කොමසාරිස් විසින් එවා ඇති ලිපිය සභාගත කරන ලදී.

පොදු වෙළඳසැල අංකඃ 08 දරණ කඩ කාමරය කිරිපැණි වෙළඳාම සඳහා බදු දී ඇති අතර මෙම කඩ කාමරය අදාල චක්‍රලේඛයට අනුව විග්‍රහ කිරීමේ දී එළවළු හා සිල්ලර කඩ ගණයට වැටෙන බැවින් , ටෙන්ඩර් කිරීමට නොහැකි බව ඉහත ලිපියෙන් දන්වා තිබුණි.

පළාත් පාලන කොමසාරිස් විසින් සඳහන් කර තිබෙන උපදෙස් පරිදි , මෙම කඩ කාමරය ටෙන්ඩර් නොකිරීමට හා දැනට බදුගෙන ඇති බදුකරුට ඉදිරි වර්ෂයන් සඳහා නැවත ගිවිසුම් අත්සන් කර ලබාදීමට තීරණය කරන ලදී.

05:07 **<u>සුනන්දාරාම වට රවුම් පාර සංවර්ධනය කිරීමඃ</u>**

බළන්ගොඩ සුනන්දාරාම මාර්ගයේ වටරවුම් පාරේ අතුරු මාර්ගය සංවර්ධනය කරගැනීමේ යෝජනාව 2010 අයවැය ලේඛනයට ඇතුළත් කර ඒ සඳහා මුදල් වෙන්කරදෙන ලෙස ඉල්ලමින්, බළන්ගොඩ , බුලත්ගම,අංකඃ264/5 , ඩබ්.ඒ.කරුණාසිරි යන විසින් එවා ඇති 2009.11.17 දිනැති ලිපිය සභාගත කරන ලදී.

මුදල් තිබෙන ආකාරය සලකා බලා ඉදිකිරීම් සිදුකිරීමට සභාව තීරණය කරන ලදී.

05:08 **<u>බැකෝ යන්ත්‍රය ක්‍රීඩාපිටිය සැකසීම සඳහා ලබාගැනීම</u>**

ර/බළන්ගොඩ සී.සී.දෙමළ මහා පාසැලේ 2010 වසරේ නිවාසාන්තර ක්‍රීඩා උත්සවයක් පැවැත්වීමට තීරණය කර ඇති බැවින් , ක්‍රීඩා භූමිය සකස් කරගැනීම සඳහා මෙම සභාවේ ඇති බැක්හෝ යන්ත්‍රය 2009.11.30 වන දින පැය 02 කට පමණ ලබාදෙන ලෙස ඉල්ලා එම විද්‍යාලයේ විදුහල්පති විසින් එවා ඇති ලිපියක් සභාගත කරන ලදී.

මුදල් අයකර අදාල සේවාව ලබාදීමට තීරණය කරන ලදී.

05:09 **<u>ස්තුතිය පළකිරීම.</u>**

බළන්ගොඩ යසෝදරා අඳ බිහිරි විද්‍යාලයේ නව දෙමහල් ගොඩනැගිල්ල 2009.10.15 වන දින විවෘත කිරීමේ උත්සවයට සහයෝගය ලබාදීම සම්බන්ධව ගරු සභාපතිතුමා උපසභාපතිතුමා/ගරු නාගරික මන්ත්‍රීතුමන්ලා හා කාර්ය මණ්ඩලයට ස්තුති කරමින් බළන්ගොඩ යසෝදරා අඳ බිහිරි ළමා නිවාස සංවර්ධන සමිතියේ සභාපති විසින් එවා ඇති ලිපියක් ගරු සභාවේ දැනගැනීම පිණිස සභාගත කරන ලදී.

05:10 **සබරගමුව පළාතේ පළාත් පාලන ආයතන ප්‍රධානීන් සඳහා පෞද්ගලික ලේකම් වරයෙකු පත්කරගැනීම**

ඉහත සඳහන් කරුණට අදාළව පළාත් පාලන කොමසාරිස් විසින් එවා ඇති 2009.11.23 දිනැති ලිපිය සභාගත කරන ලදී.

පළාත් පාලන ආයතන ප්‍රධානීන් සඳහා ඔවුන්ගේ ධුර කාලයට පමණක් සීමා වන සේ කොන්ත්‍රාත් පදනමින් මාසිකව රු.5000/- ක දීමනාවක් මත 2009.12.01 දින සිට ක්‍රියාත්ක වන පරිදි පෞද්ගලික ලේකම්වරයෙකු පත්කර ගැනීමට අනුමැතිය ලබා දී ඇති බව එමගින් දන්වා තිබිණ.

1. සභා අරමුදලින් මේ සඳහා වියදම් දරණ බැවින් සභා තීරණයක් ලබාගත යුතුය.

2. දෙවරකට නොවැඩි වාර ගණනක දී අ.පො.ස.(සා/පෙළ ) ගණිතය,සිංහල ඇතුළු විෂයන් හයක් සමත් වී තිබිය යුතු අතර , ඉන් විෂයයන් හතරකට සම්මාන සාමාර්ථය ලබා තිබිය යුතුය.

3. මාසිකව ගෙවනු ලබන මෙම දීමනාවෙන් සේවකයා විසින් සේවක අර්ථසාධක අරමුදලට වන දායකත්වය වෙනුවෙන් 08% ක් ගෙවිය යුතු වන්නේය. 12% ක් ආයතනය විසින් දැරිය යුතු වන්නේය.

4. මෙම සේවකයා සභාවේ ස්ථිර කාර්ය මණ්ඩලයේ සේවකයෙකු නොවන අතර, මෙම යොදවා ගැනීම ස්ථිර තනතුරක් සඳහා අයිතිවාසිකමක් ද නොවන්නේය.

5. පළාත් පාලන ආයතනය විසින් මේ වන විටත් සේවා ගිවිසුම මත මෙකී කාර්යයන් සඳහා යොදවා ගෙන සිටින සේවකයින්ගෙන් මෙම අවශ්‍යතාවය ඉටුකරගැනීමට කටයුතු කල යුතුය.

6. මාසයේ අවසානයේ අදාල දීමනාව ගෙවිය යුතු අතර මාසයට අඩු කාලයක් සේවය කර ඇති අවස්ථාවල දී දින ගණනට සමානුපාතිකව ගණනය කර දීමනාව ගෙවිය යුතුය.

ඉහත සඳහන් කොන්දේසි වලට යටත්ව සුදුසු සේවකයෙකු සභා අරමුදලින් අදාල වියදම් දැරීමට යටත්ව බඳවා ගැනීමට ගරු සභාපතිතුමා විසින් යෝජනා කල අතර , එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් සභා සම්මත විය.

05:11 **කොම්පෝස්ට් පොහොර ලබාගැනීම සඳහා :**

ර/බලන්ගොඩ සී/ස.දෙමළ මහා විද්‍යාලයේ පරිසරය අලංකාර කරගැනීමට සහ භෝග වගාවට අවශ්‍ය කොම්පෝස්ට් පොහොර මිටි 20 ක් පමණ මෙම ආයතනය මගින් ලබාදෙන ලෙස ඉල්ලා එම විද්‍යාලයේ විදුහල්පති විසින් එවා ඇති 2009.11.25 දිනැති ලිපිය සභාගත කරන ලදී.

මේ සඳහා සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:12 **විවිධ ප්‍රසංගයට අවශ්‍ය උපකරණ ලබාගැනීම සඳහා:**

2009.12.04 වන දින වැවේවත්ත පෙර පාසලෙහි සංවිධානය කර ඇති විවිධ ප්‍රසංගයට පහත සඳහන් උපකරණ ලබාදෙන ලෙස ඉල්ලා ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

01. ශබ්ද විකාශන යන්ත්‍ර
02. පුටු 50 ක්
03. සහතික පත්‍ර 42

අදාල උපකරණ ලබාදීමටත් සභා අරමුදලින් සහතික පත්‍ර මුද්‍රණය කරදීමටත් අනුමැතිය ලබාදෙන ලදී.

05:13 **කාර්ය සාධන අරමුදලෙන් ණය ලබාගැනීම:**

බළන්ගොඩ නගර සභා වැව්වත්ත පෙර පාසලෙහි සේවය කරනු ලබන පෙර පාසලෙහි සේවය කරනු ලබන ටී.ඒ.එල්.පිලිප්,එම්.බුද්ධිමා ගෝමස් යන පෙර පාසල් පාලිකාවන් දෙදෙනා විසින් සිය අධ්‍යාපන කටයුතු කරගෙන යාමට කාර්ය සාධන අරමුදලින් රු.15000/- ක ණය මුදලක් ලබාදෙන ලෙස ඉල්ලා ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

ස්ථිර ඇපකරයකට යටත්ව අදාල ණය මුදල ලබාදීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:14 **නගර සභා බල ප්‍රදේශය පුළුල්වීමත් සමඟ ඡන්ද මධ්‍යස්ථාන වෙනස් කිරීම :**

උක්ත කරුණට අදාළව , රත්නපුර දිස්ත්‍රික්කයේ ජ්‍යෙෂ්ඨ සහකාර මැතිවරණ කොමසාරිස් විසින් එවා ඇති 2009.11.12 දිනැති ලිපිය සභාගත කරන ලදී.

බුලත්ගම ඡන්දදායකයින් හට බුලත්ගම සිරි සුනන්දාරාම ඡන්ද මධ්‍යස්ථානය වෙනුවට ර/ බළන්ගොඩ දෙමළ විද්‍යාලය ද , කිරිඳිගල ඡන්දදායකයින් හට ඕළුගන්තොට ගංගාරාම විහාරස්ථානය ශාලා අංකඃ 01 ඡන්ද මධ්‍යස්ථානය වෙනුවට අනඳමෙත්ගම ප්‍රජා ශාලාව ද ඡන්ද මධ්‍යස්ථානය ලෙස යොදා ගෙන ඇති එමගින් දන්වා ඇති බව ගරු සභාපතිතුමා විසින් සභාව වෙත පැහැදිලි කරන ලදී.

05:15 **පළාත් පාලන ආයතන ලේකම්වරුන්ගේ පෞද්ගලික දුරකථන ගාස්තු සභා අරමුදලෙන් ගෙවීම :**

ඉහත සඳහන් කරුණට අදාළව පළාත් පාලන කොමසාරිස් විසින් එවා ඇති 2009.11.24 දිනැති ලිපිය සභාගත කරන ලදී.

පළාත් පාලන ආයතන වල ලේකම්වරුන්ට පෞද්ගලික දුරකථන ගාස්තු උපරිම වශයෙන් රු.1500/- ක මාසික දීමනාවක් පහත සඳහන් කොන්දේසි වලට යටත්ව සභා අරමුදලින් ගෙවීමට ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ අනුමැතිය ලැබී ඇති බව දන්වා තිබිණ.

1. අදාල නිලධාරියාගේ නමට දුරකථනය තිබිය යුතුය.

ii. ගෙවීම් කිරීමේ දී වවුචරයට දුරකථන බිල්පතේ සහතික කල පිටපතක් ඇමිණිය යුතුය.

iii. සභාව විසින් අනුමත කරන ලද මුදල හෝ මාසික දුරකථන බිල යන දෙකෙන් අඩු මුදල ගෙවිය යුතුය.

iv. අයවැය ලේඛනය මගින් ප්‍රතිපාදන සලසා තිබිය යුතුය.

v. අනුමත කර ඇති රු.1500/- ක උපරිමය තුළ ගෙවීම් කිරීමේ දී සභාවෙන් අනුමැතිය ලබාගත යුතුය.

vi. 2009 දෙසැම්බර් මස සිට ගෙවීම් ක්‍රියාත්මක කිරීම.

vii. ලේකම් ධූරයේ වැඩ බැලීමේ පදනමින් පත්කර ඇති නිලධාරීන් සඳහා ද මෙම දීමනාව හිමි බව සැලකිය යුතුය.

ඉහත සඳහන් කොන්දේසි වලට යටත්ව සහා අරමුදලින් රු.1500/- ක උපරිමයකට යටත්ව වියදම් දැරීමට සභාව තීරණය කරන ලදී.

05:16 **සුදර්ශනපුර ඉහල නිවාස පේළියේ පාර කොන්ක්‍රීට් කිරිම :**

සුදර්ශනපුර ඉහල නිවාස පේළියේ පාර කොන්ක්‍රීට් කරදෙන ලෙස ඉල්ලා සුදර්ශනපුර ගම්වාසීන් විසින් එවා ඇති ලිපියක් සභාගත කරන ලදී.

මුදල් ලැබෙන පරිදි සංවර්ධනය කිරීමට අනුමැතිය ලබාදෙන ලදි.

05:17 **මුදල් අඩු කිරීම - බළන්ගොඩ බස්නැවතුම්පල පොදු වැසිකිලියඃ**

පසුගිය දිනවල පැවති අධික වර්ෂාව හේතුවෙන් වැසිකිලි වල පිරීම නිසා මුදල් අයකරගැනීමට නොහැකි වු බැවින් , 2009.05.08.09.10.11 හා 12 යන දිනයන් සඳහා තැන්පත් කරන ලද මුදල අඩුකර දෙන ලෙස ඉල්ලා බදුකරු බී.ගුණරත්න මහතා විසින් ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

මේ සම්බන්ධව සලකා බැලු සභාව , මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතාගේ නිර්දේශයට යටත්ව අදාල දින අඩුකර ගෙවීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:18 **විරිරේඛා සහතික,නෙපවරා ගැනීමේ සහතික,ඔප්පු ලුහුඬු පිටපත් ,විදුලිය, ඉල්ලුම්පත් හා ජල සැපයුම් ඉල්ලුම්පත්‍ර සඳහා ගාස්තු අයකිරීමඃ**

මෙම නගර සභාව විසින් ඉහත සඳහන් සහතික නිකුත් කිරීමට වැට් සමග පළමුවෙන් රු.115/- ක මුදලක් අයකරන අතර , එම සහතිකය නිකුත් කරන අවස්ථාවේ දී ඊට අදාළ ගාස්තු වෙනම අයකරනු ලබන බැවින් , මෙය සේවාලාභීන්ට ගැටළු සහගත තත්ත්වයක් වන නිසා , සෑම ඉල්ලුම්පත්‍රයක්ම නොමිලයේ නිකුත් කිරීමටත් අදාල සහතිකය නිකුත් කරන අවස්ථාවේ දී එම ඉල්ලුම්පත්‍ර ගාස්තුව ද සමඟ එකම ගාස්තුවක් අයකිරීම සුදුසු බව සදහන් කරමින් ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

2009.12.01 දින සිට ඉහත සඳහන් ආකාරයට මුදල් අයකිරීම සුදුසු බවට සභාව තීරණය කරන ලදී.

05:19 **ශ්‍රමදානය සඳහා අවශ්‍ය ද්‍රව්‍ය ලබාගැනීමඃ**

බළන්ගොඩ නගර සභා මහජන පුස්තකාලයේ පාඨක සමාජය විසින් දෙසැම්බර් මස 01 වන දින බළන්ගොඩ රෝහල පිරිසිඳු කිරීමේ ශ්‍රමදානයක් සංවිධානය කර ඇති බැවින් , ඊට සහභාගීවන සාමාජික සාමාජිකයාවන්ට සංග්‍රහ කිරීම සඳහා පහත සඳහන් ද්‍රව්‍ය ලබාදෙන ලෙස ඉල්ලා ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

කේක් කිලෝ 03
නිව්ඩේල් කිරි පැකට් 50
බැනර් 01

අවශ්‍ය ද්‍රව්‍ය සහා අරමුදලින් මිළදී ගෙන ලබාදීමට සභාව තීරණය කරන ලදී.

05:20 **ශාන්ත ජෝශප් වැඩිහිටි නිවාසයට පැමිණෙන මාර්ගය දෙපස පිළිසකර කරදෙන ලෙස ඉල්ලීම:**

උක්ත කරුණට අදාළව බළන්ගොඩ ශාන්ත ජෝශප් වැඩිහිටි නිවාසයේ ප්‍රධාන පාලිකාව විසින් එවා ඇති 2009.11.25 දිනැති ලිපිය සභාගත කරන ලදී.

ශාන්ත ජෝශප් වැඩිහිටි නිවාසයට පැමිණෙන දෙපස මාර්ගය වසර ගණනාවක් පිළිසකර නොකිරීම නිසා ඉතා අබලන් තත්ත්වයේ පැවතෙන හෙයින් එම වැඩිහිටියන්ට ගමන් කිරීම ඉතා අසීරු තත්ත්වයකට පත්ව ඇති අතර , එමෙන්ම , වාහන ගමන් කිරීමට ද අසීරුව පවති. එබැවින් , මේ සම්බන්ධව අවධානය යොමු කර එම මාර්ගයට තාර දමා පිළිසකර කරදෙන ලෙස ඉල්ලා තිබිණ.

මේ සම්බන්ධව නිරීක්ෂණය කර වාර්තාවක් ලබාදෙන ලෙස වැඩ අධිකාරී මහතා වෙත දැණුම් දීමට සභාව තීරණය කරන ලදී.

05:21 **ගලි බවුසරයේ සේවය ලබාගැනීම:**

බළන්ගොඩ ශාන්ත ජෝශප් වැඩිහිටි නිවාසයේ වැසිකිලි වලවල් හිස් කිරීම සඳහා ගලි බවුසරයේ සේවය ලබාදෙන ලෙස ඉල්ලා ශාන්ත ජෝශප් වැඩිහිටි නිවාසයේ ප්‍රධාන පාලිකාව විසින් එවා ඇති ලිපියක් සභාගත කරන ලදී.

පොදු කටයුත්තක් සේ සලකා අදාළ සේවාව නොමිළයේ ඉටුකරදීමට සභාව තීරණය කරන ලදී.

05:22 **හිඟ දුරකථන බිල්පත් පියවීම:**

ඉහත සඳහන් කරුණට අදාළව මෙම සභාවේ ගරු නාගරික මන්ත්‍රී ඩබ්.විමලසේන මැතිතුමා විසින් ඉදිරිපත් කර 2009.11.25 දිනැති ලිපිය සභාගත කරන ලදී.

සභාපතිතුමා නමින් තමා වෙත ලබාදී ඇති දුරකථනය සඳහා මාසිකව රු.1500/- ක පමණ දැරිය නොහැකි මුදලක් බිල්පතට එකතු වීම නිසා තමා එම දුරකථනය බොහෝ කලක්

පාවිච්චි නොකල බවත්, කෙසේ වෙතත් මෙතෙක් එකතු වී ඇති මුදල තමා ගෙවිය යුතු වන නිසා , සභාපති හා නාගරික මන්ත්‍රීතුමන්ලාගේ අරමුදලින් එම මුදල ගෙවා තමාගේ මාසික දීමනාවෙන් අදාල මුදල අයකරගන්නා ලෙස ඉල්ලා තිබිණ.

දුරකථන බිල්පත සම්බන්ධව සභාවට සම්බන්ධතාවයක් නොමැති හෙයින් ,පෞද්ගලිකව එම මුදල ගෙවන ලෙස දැණුම් දීමට සභාව තීරණය කරණ ලදී.

05:23 **සභාවේ සංවර්ධන කටයුතු සඳහා වැලි ලබාගැනීමඃ**

සභා කර්මාන්ත කිහිපයක වැඩ ඉතා ඉක්මණින් අවසන් කිරීමට ගරු සභාපතිතුමා විසින් උපදෙස් ලබා දී ඇති අතර , මෙම දිනවල පවතින අධික වර්ෂාව නිසා වැලි සැපයුම්කරුට වැලි සපයාදීමේ අපහසුතාවක් තිබෙන බවත්, එම නිසා වෙනත් සැපයුම්කරුවකුගෙන් වැලි ලබාගැනීමට අවශ්‍ය කටයුතු ඉටුකරදෙන ලෙස ඉල්ලමින් ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

වර්ෂය මුලදී ලබාදුන් මුදලට වැලි සපයාදීමේ අපහසුතාව සම්බන්ධව සැපයුම්කරුගෙන් කරුණු විමසීමට තීරණය කරන ලදී.

05:24 **ජාතික සවිය - ගැම නැගුම 2009**

ඉහත සඳහන් කරුණට අදාළව බළන්ගොඩ ප්‍රාදේශීය ලේකම් විසින් මෙම සභාවේ ගරු සභාපතිතුමාට ද පිටපත් සහිතව රත්නපුර දිස්ත්‍රික් ලේකම් වෙත යවන ලද ලිපියේ පිටපතක් සභාගත කරන ලදී.

බළන්ගොඩ ග්‍රාම නිලධාරී වසම බළන්ගොඩ සභාව හා බළන්ගොඩ ප්‍රාදේශීය සභාව යන පළාත් පාලන ආයතන දෙකටම අයත් වසමක් වන අතර , ඉහත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර ඇත්තේ බළන්ගොඩ ප්‍රාදේශීය සභාවේ බල ප්‍රදේශය තුළය. බළන්ගොඩ වසම සම්බන්ධීකරණය කිරීම සඳහා ප්‍රාදේශීය සභාවෙන් මන්ත්‍රීවරයෙකු තෝරා පත්කර නොමැති අතර , නගර සභාවෙන් බළන්ගොඩ වසමේ සම්බන්ධීකරන මන්ත්‍රීතුමා ලෙස නගර සභාවේ ගරු සභාපතිතුමා කටයුතු කරයි.

මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ දී දැන්වීම් පුවරුව සඳහා ඡායාරූප ඇතුළත් කිරීම ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු කරන කොන්ත්‍රාත්කාර සමිතියට ගැටළුවක් වී ඇති බවට මා වෙත වාර්තා කර ඇත. එයට හේතුව වන්නේ නගර සභාවේ හා ප්‍රාදේශීය සභාවේ ගරු සභාපතිතුමන්ලා දෙදෙනාම දැන්වීම් පුවරුවට තම ඡායාරූප ඇතුළත් කරන ලෙස ඉල්ලා සිටීම යැයි දන්වමින්, ඒ සම්බන්ධව උපදෙස් ලබාදෙන ලෙස ඉල්ලා තිබිණ.

දැන්වීම් පුවරුවට යෙදිය යුත්තේ අදාල වසම සම්බන්ධීකරණය සිදුකරන මන්ත්‍රීවරයාගේ ඡායාරූපය වන බැවින් , ඒ අනුව කටයුතු කරන ලෙසත් , බළන්ගොඩ වසම ඇතුළු ගරු සභාපතිතුමා සම්බන්ධීකරණය සිදුකරනු ලබන සියළු වසම් වල එතුමාගේ ඡායාරූපය දැන්වීම් පුවරු වලට ඇතුළත් කළ යුතු බව දැණුම් දීමටත් සභාව තීරණය කරන ලදී

05:25 **මහජන පොළ ඉදිකිරීම - 1 අදියර** :

ඉහත සඳහන් කරුණට අදාළව ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

බළන්ගොඩ මහජනපොළ ඉදිකිරීමට එරෙහිව තිබූ නීතිමය කටයුතු හේතුවෙන් එහි ඉදිකිරීම් කටයුතු ප්‍රමාද කිරීමට සිදු වූ බැවින් , ගිවිසුම් කාලය දින 60 කින් දීර්ඝ කරන ලෙස කොන්ත්‍රාත්කරු විසින් ඉල්ලා ඇති අතර ,ඒ සඳහා විධායක ඉංජිනේරුගේ නිර්දේශයන් ද ඉදිරිපත් කර ඇති එබැවින් , තවත් දින 60 කින් කාර්ය සංසිද්ධි ඇපකරය ද දීර්ඝ කර ලබාගෙන ගිවිසුමේ කාලය දීර්ඝ කිරීම කලයුතු බව දන්වා තිබිණ . දින 60 ක කාලයක් කාලය දීර්ඝ කිරීමට සභාව තීරණය කරන ලදී.

## 05:26 මෝටර් රථ රක්ෂණ ආවරණ ලබාගැනීම:

පහත අංක සඳහන් වාහන වල රක්ෂණ කාල සීමාව 2009.12.01 දිනෙන් අවසන්වීමට නියමිත බැවින් , ඒ සඳහා උපදෙස් අනුමැතිය පතමින් ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

01. එච්.එෆ්.8558 ට්‍රැක්ටරය.
02. එච්.එෆ්.8952 ට්‍රැක්ටරය.
03. එච්.එෆ්.2269 ට්‍රේලරය.
04. එච්.එෆ්.2234 ට්‍රේලරය
05. 56-1906 ක්‍රෑෂ කැබ් රථය

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙන් රක්ෂණය කරගැනීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

## 05:27 පොදු වෙළඳසැල මාළු කඩ ටෙන්ඩර් කිරීම:

බලන්ගොඩ නගර සභාව සතු පොදු වෙළඳසැලේ ජල හා විදුලි බිල් සඳහා හා දැරීමට සිදුවන අනෙකුත් වියදම් ඉන් ලැබෙන ආදායම අභිබවා යන බැවින් , පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛ අංක: 2009 / 1 චක්‍රලේඛය අනුව වාර්ෂිකව ටෙන්ඩර් කිරීමට හැකි බැවින් , එම කඩ ටෙන්ඩර් කර සභාවේ ආදායම වැඩිකර ගැනීමට හැකි බැවින් , 2010 වර්ෂය සඳහා ටෙන්ඩර් කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදී. එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී , එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙම යෝජනාව සම්බන්ධව පොදු වෙළඳසැල මාළු කඩ වලට අදාළ පවරන ලද නඩුවෙහි නීතිඥයාට අදාළව ගැටළුවක් නොපවතින්නේ නම් හා පළාත් පාලන කොමසාරිස්ගේ වෙතින් උපදෙස් විමසා ඒ අනුව කටයුතු කිරීම සුදුසු බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී. මෙහි දී ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජයන්ත ප්‍රේමකුමාර,එම්.නිමල් කරුණාරත්න, එම්.ටී.එම්.රූමි යන මන්ත්‍රීතුමන්ලා අදාල යෝජනාව සම්බන්ධයෙන් ඉහත එකඟතාවය පළකරන ලදී. ඒ අනුව පැමිණ සිටි මන්ත්‍රීවරුන් 06 දෙනාගෙන් ගරු සභාපතිතුමා ඇතුළු බහුතර මන්ත්‍රී 04 දෙනෙකු විසින් ඉහත එකඟතාවය පළකරන ලද බැවින් බහුතරයකගේ එකඟතාව මත යෝජනාව සභා සම්මත විය.

## 06. 2009.10.23 දින සිට 2009.11.20 දින දක්වා රු.10000/- ට වැඩි ගෙවීම්

| දිනය | විස්තරය | වවු.අංකය. | චෙක්. අංකය. | මුදල |
|---|---|---|---|---|
| 09.10.23 | ඩැක්ස් ඉංජිනියරින් පු. සමාගම බොබ් කැට් යන්ත්‍රයේ මීටර් පැය 1500 සේවාව සඳහා මුදල් ගෙවීම. | 50 | 643969 | 4480115 |
| 10.29 | H.L.W.ඉංජිනියරින් සර්විස් . 227-5020 ගලි බවුසරයට සොකට්සොබර් 02 ක් හා තවත් අමතර කොටස් මිලදී ගැනීම. | 53 | 643972 | 15110.00 |
| | ශ්‍රී ලංකා ටෙලිකොම් ලිමිටඩ් .දූරකථන බිල්පත් පියවීම. 2287022-2882.48 (09/09)<br>2287024-6829.99 (09/09)<br>045-3452931 2337.05 (09/08-9)<br>2288400-10314.08 (09/08-9) | 56 | 643975 | 22363.60 |

| | | | | |
|---|---|---|---|---|
| | | | | |
| 09.10.30 | සභාපති ර/ශාන්ත ඇග්නස් බාලිකා විද්‍යාලීය පාසල් සංවර්ධන සිමිතිය.<br>ප්‍රතිචක්‍රීකරණය කල හැකි කසල මිලදී ගැනීමේ මධ්‍යස්ථාන ඉදි කිරීම.20/ අත්තිකාරම් ගෙවීම.<br>මුළු මුදල - 265580.00<br>20% - 53116.00 | 58 | 643977 | 53116.00 |
| | සභාපති ර/ශාන්ත ඇග්නස් බාලිකා විද්‍යාලීය පාසල් සංවර්ධන සිමිතිය.<br>ප්‍රතිචක්‍රීකරණය කල හැකි කසල මිලදී ගැනීමේ මධ්‍යස්ථාන ඉදි කිරීම.20/ අත්තිකාරම් ගෙවීම.<br>මුළු මුදල - 265580.00<br>20 - 53116.00 | 59 | 643978 | 53116.00 |
| | තාවකාලික වැටුප- ආදායම් අංශය.<br>නගර සභා බල ප්‍රදේශයේ දේපල තක්සේරු කිරීමේ සහායකයින් සඳහා දීමනා ගෙවීම. | 61 | 643980 | 89000.00 |
| 09.11.03 | 2009 නොවැම්බර් මාසය .<br>ශ්‍රී ලංකා පලාත් පාලන ආයතනයන්ගේ සංසදයේ වාර්ෂික ලියා පදිංචි ගාස්තු. | 01 | 643986 | 10000.00 |
| 09.11.03 | ජේ.ජී.පී. වික්‍රමසිංහ<br>පුස්තකාලයට හා කියවීම් ශාලාවට පුවත් පත් සැපයීම වෙනුවෙන් ගාස්තු ගෙවීම. | 06 | 643991 | 15670.00 |
| | සාමාන්‍යාධිකාරී ලංකා විදුලි බල මණ්ඩලය.<br>2009 සැප්තැම්බර් මස විදුලි බිල පියවීම.<br>කාර්යාලය - 12330ග00<br>යාබද ගොඩනැගිල්ල - 747.00<br>13077.00 | | | |
| | ඔබ්. එම්. ඉන්ටනැෂනල් පු. සමාගම .<br>සෞඛ්‍ය අංශයේ සම්පත් පියස මධ්‍යස්ථාන සඳහා ඉලෙක්ටොනික් තරාදියක් මිලදී ගැනීම. | 11 | 643993 | 48000.00 |
